
# වඳුරු පැංචාට පාඩමක්



මනුෂී නවරත්න

# වඳුරු පැංචාට පාඩමක්


මනුෂී අනන්‍ය නවරත්න

කතෘ

රශ්මී ඉන්ද්‍රචාපා සමරකෝන්

සිත්තම්



මහාමායා බාලිකා විදුහල

1 වසර D

2025/02/08

ISBN -IS37031

## ~ පිදුම ~

කතන්දර ගොතන්නට මා දිරි ගැන්වූ,
නිදන්න පෙර අදටත් රස බර කතා ගොතන
කිරි අම්මාටත්,

කතා වල සේම වීරයෝ සැබෑ ලෝකයෙත්
ඉන්නා බව පසක් කල මගේ වීරයා
අප්පච්චීටත්,

ආදරයෙන්

~

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර් ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර් ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි .පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම සංව ර් ධන පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන්න ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථ දස්සී මාහිමිපාණන් වහන්සේට උපහාරය පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යලිත් ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරණ **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනය ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම ලැබීම ලැබීමේ වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතය මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් නිසා එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය

**විදුහල්පතිනිය**
**ශෂිකලා සේනාධිර**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

## ~ වඳුරු පැංචාට පාඩමක් ~

ඔන්න එක රටක තනිවෙච්ච වඳුරු පැංචෙක් ජීවත් වුණා. මේ වඳුරු පැංචා හරිම දඟකාරයි.

දවසක් උදේම අවදි වුණ වඳුරු පැංචා කෑමක් හොයාගෙන යන්න සූදානම් වෙනකොටම දැක්කා දං ගෙඩියක් හොටෙන් අරන් පියාඹාගෙන යන කුරුළු පැටවෙක්.

දැන් ඉතින් වඳුරු පැංචාට ඉවසීමක් නැහැ රසම රස පැණි බේරෙන දං ගෙඩියක රස බලනකන්.

මොකද, මේ වඳුරු පැංචාගේ ප්‍රියතම පලතුර වුණෙත් දං ගෙඩි .

පැණි බේරෙන දං ගෙඩි හොයාගෙන කොච්චර දුරක් උනත් අතු අතර පැන පැන වනන්තර පුරා යන්න වඳුරු පැංචා පුරුදු වෙලා හිටියා.

මේ වඳුරු පැංචා හරි නරක පුරුද්දකුත් තිබ්බා, මොකක්ද ඒ නරක පුරුද්ද?

ඒ තමා, තමන්ට දෙයක් ආස හිතුණොත් මෙයාට ඒක කොහොමහරි ඕන ඉතින්. ඒක කාටද අයිති කියලාවත් අසා බලා ගන්නවත් ඉවසිල්ලක් මේ වඳුරු පැංචාට තිබුණේ නැහැ.

මේ නරක ගතිගුණේ හින්දා වඳුරු පැංචාට අමාරුවේ වැටුන අවස්ථා ගොඩාක් තිබ්බා වගේම මුරන්ඩුකම නිසාම වඳුරු පැංචාට යහළුවෝ කවුරුත් හිටියේ .



වඳුරු පැංචා ඕන්න දැන් ගස් උඩින් පැන පැන

ලස්සන පරිසරයත් බල බලා ගංගා ඇළ දොළ

පහු කරගෙන රස දන් ගෙඩි හොයාගෙන

යනවා.

මේ විදිහට දත් ගෙඩි හොයාගෙන යනකොට මෙයා හම්බවෙන හැම දං ගෙඩියම රස බලනවා. ඉදිච්ච නැති ගෙඩි කඩනවා ඒවා අඩක් කාලා වීසි කරනවා.

වඳුරු පැංචා මේ කරන නාස්තිය දකින හැම සතෙක්ම වඳුරු පැංචාට අවවාද කරා. හැබැයි වඳුරු පැංචා මේ කිසි දෙයක් ගණනකට ගත්තේ නම් නැහැ.

මෙහෙම දං ගෙඩි හොයාගෙන යන ගමනෙදි මෙයා දකිනවා ලස්සන උද්‍යනයක් .

රෝස පාට, කහ පාට ,රතු පාට දම් පාට මල් පිපිලා හරිම ලස්සනයි. ඒ වගේම උද්‍යානය පුරා විවිධ ජාතියේ පලතුරු පිරිලා.

වඳුරු පැංචා කවදාවත්ම දැකලා පලතුරුත් මේ උද්‍යනයේ තිබුණා.

මේ විදිහට උද්‍යානයේ හැම පලතුරකම රස බල බලා පළතුරු සෑහෙන ප්‍රමාණයක් මේ වඳුරු පැංචා නැති නාස්ති කරලා දැම්මා.

මේ විදිහට අත්තෙන් අත්තට පැන පැන උද්‍යානයේ තියෙන ලස්සනට මත් වෙලා යන වඳුරු පැංචා දැක්කා පොකුණක් මැද පිපිලා තියෙන ලස්සන රත්තරන් පාට මලක්.

වඳුරු පැංචාට ඇස් දෙක අදහගන්න බැරුව ගියා. එයා කොච්චර කැලේ ඇවිදලා තිබ්බත් කවදාවත් රත්තරන් පාට මලක් නං දැකල තිබ්බේ නෑ.

ඔන්න ඉතින් වඳුරු පැංචාගේ අර නරක පුරුද්ද එළියට ආවා. මොකක්ද ඒ නරක පුරුද්දා?

තමන්ට අයිති නැති දේවල් ඒ දේවල් අයිති අයගෙන් අහන්නැතුව ගන්න එක, කන එක කඩන එක.

ඉතින් දැන් වඳුරු පැංචා ඉවසිල්ලක් නැහැ මේ මල කඩලා තමන්ගේ අතට ගන්නකන්ම.

ඔන්න ඉතින් අර ලස්සන මල පිපිලා තියෙන පොකුණ මැදට ගිහිල්ලා හරිම ලස්සනට පරිස්සමට පිපිලා තිබ්බ රත්තරන් මල මේ වඳුරු පැංචා කඩලා අතට ගත්තා.

වඳුරු පැංචා මේ මලේ සුවඳ බැළුවා. පුදුමාකාර සුවඳක් මේ මලට තිබුණේ.

මේ විදිහට  ඒක අතට අරගෙන බල බල ඉන්න කොට මෙයාට ඇහුණා ඈත ඉඳලා

"අනේ එපා! "

කියලා කෑ ගහන හඬක්.

වඳුරු පැංචා  වඳුරා කලබල වුනා.

හරිම ලස්සන චූටි කුමාරිකාවක් තමා වඳුරු පැංචා දිහාවට දුවගෙන ආවේ.

ඇවිල්ලා වඳුරාගෙන් අඬ අඬ ඇහුවා.

"අනේ ඇයි ඔය මල කඩලා දැම්මේ?"

වඳුරු පැංචා කර කියා ගන්න දෙයක් නැතුව ගියා.

පොඩි කුමාරිකාව අඬන එක නවත්තන්නේත් නෑ.

මේ කළබලය ඇහිලා උද්‍යානයේ අයිති රජතුමත් එතනට ඉක්මනින් ආවා.

දැන් අර පුංචි කුමාරිකාව අඬ අඬ අහනවා වඳුරු පැංචාගෙන්

" ඇයි ඔයා ඒ මල කැඩුවේ කියලා "

" ඇයි ඔයාගේ අම්මාටත් සනීප නැන්ද කියලා. "

වඳුරු පැංචාට මේ කිසි දෙයක් තෙරෙන්නේ නැහැ .

වඳුරු පැංචා කුමාරිකාවගෙන් ඇහැව්වා ඇයි ඔයාට මේ මල මෙච්චර වටින්නේ කියලා.

කුමාරිකාව අඬ අඬ වඳුරු පැංචාට කිව්වා

“මම ඔය මල පරිස්සම් කරගෙන තියාගෙන හිටියේ මගේ අම්මාව සනීප කරගන්න”

ඔය මල හරියටම වැඩිලා ඉවර වුණා ඒක දිලිසෙන්න ගන්නවා එතකොට එකේ යුෂ පානය කළාම මට අසනීපයෙන් ඉන්න මගේ අම්මාව සුව කරගන්න පුළුවනි .

වඳුරු පැංචට ගොඩාක් දුක හිතුනා. මොකද අම්මා හිටියෙත් නැහැ තාත්තා හිටියෙත් නැහැ.

ඉතින් වඳුරු පැංචා කුමාරිකාගෙන් වගේම රජතුමාගෙනුයි සමාව ඉල්ලුවා.

සමාව ඉල්ලලා පොරොන්දු වුණා කැලෑ පුරා පීරලා ඒවගේම මලක් හොයලා රජ බිසව සුවපත් කරන්න උදව් කරන්න.

මේ විදිහට කවදාවත්ම නොතිබුණු උනන්දුවකින් වඳුරු පැංචා කැලයෙන් කැලයට මාරු වෙවී ඒ ජාතියේ මලක් හොයන්න මහන්සි වුණා. දිවා රෑ නොබලා වනාන්තර පිරමින් වඳුරු පැංචා රත්තරන් මල හොයන්න වෙහෙස වුණා.අන්තිමේදි වඳුරු පැංචාගේ උත්සාහය හින්දා ඒ ජාතියේ මලක් හොයාගන්න වඳුරු පැංචා සමත් වුණා

ඒක රජතුමාට ගෙනල්ල දුන්නා වඳුරු පැංචා ආයෙමත් පුංචි කුමාරිකාවගෙන් හා රජතුමාගෙන් සමාව ඉල්ලුවා.

හැබැයි මේ සිද්ධිය නිසා වඳුරු පැංචා හොඳ පාඩමක් ඉගෙන ගත්තා.

මොකක්ද මේ පාඩමේ ..........

තමන්ට අයිති නැති, වෙන කෙනෙකුට අයිති කිසිම දෙයක් අයිති කෙනාගෙන් අහන්නේ නැතුව කවදාවත්ම වඳුරු පැංචා නම් ගන්න හිතුවෙවත් නැහැ.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යයේ ප්‍රබෝධය යත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් උප නැංවීමේ සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහු විධ පරමාර් ථ ඇතිව 2017 වසරේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර් යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛන අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යයක කේතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි .පාසැලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවරේ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරු හවතුන් දෙමව්පියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මෙහිදී මහාමාය බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරු භවතුන් දෙමව්පියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය .මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවකුට ලැබෙන අශ්වාදය අන් කිසිවකින් ලබා දිය නොහැක. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිත යට එක්වීමත් සමඟ දරුවන් ඒයින් දුරස්ථ වීම අධ්‍යාපනය ගුණාත්මක බවට අනාර් ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර් මාණය වීමට හේතු වී ඇති බව පරියේෂණාත්මකව සනාථ වෙයි.තාක්ෂණය යුගයේ ස්මාර් ට් බාල බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර් මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර් මාණ හැකියාව තුළ එයට පිවිසී පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂණ

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක**
**සෙනවිරත්ත මහලේකම්**

ISBN -IS37031